# දේශජ විසඳුම්

මේ වෙසක් සතිය නො වේ. එහෙත් අපට බුදු බණ මතක් වන්නේ බටහිර ලෝකයේ අර දිනය මේ දිනය පවත්වන ආකාරයට අවුරුද්දකට වරක් නො වේ. අපට හැමදාම වෙසක් ය. එයට හේතුව අප ප්‍රශ්න අවබෝධ කරගැනීමට උත්සාහ කරන්නේත් ඒවාට විසඳුම් සොයන්නේත් බෞද්ධ සංස්කෘතියක වීම ය. දෙමළ ප්‍රශ්නය වේවා, මෙරට ආර්ථික සංවර්ධනය වේවා, විශ්වයේ සිදුවන්නේ යැයි කියන ප්‍රසාරණය වේවා, ක්වොන්ටම් භෞතිකය වේවා අපට පෙනෙන්නේ බෞද්ධ සංස්කෘතික පසුබිමක ය. අවුරුදු විසිපහකට පමණ පෙර අපට එරෙහි වූ විවිධ පඬිවරු ඊනියා යථාර්ථයක් බදාගෙන අපට පහර දී අපේ මතවාද පරාජය කිරීමට උත්සාහ ගත්හ. අද ඔවුන් දක්නට නැත. එහෙත් අද අපේ පැත්තේ යැයි කියන්නෝ අප ථෙරවාදී බුද්ධදහමින් වෙනස් වන්නේ කොතැනක දී දැයි සොයා බැලීමට මහත් උනන්දුවක් දක්වති. ඔවුහු ථෙරවාදයේ ඇතැයි කියන ඊනියා යථාර්ථයකින් දමා ගසා අප වට්ටා දැමීමට, අප සිංහල බෞද්ධයන් අතර අප්‍රසාදයට පත්කිරීමට උත්සාහ දරති. සත්භව, ක්‍ෂණවාදය, ධර්මතාව, මනස ආදිය පිළිබඳ ව ඇතැම් ථෙරවාදී උගතුන් දරන මත හා අප දරණ මත අතර වෙනස්කම් ඇත. ඒ පිළිබඳ ව "සියපත" මගින් විස්තරාත්මක ව සාකච්ඡා කිරීමට කාලය එළඹ ඇතැයි අපි විශ්වාස කරමු.

දැන් ප්‍රභාකරන් හා දෙමළ ත්‍රස්තවාදය පරාජය කෙරී ඇති හෙයින් අප අප්‍රසාදයට පත්කර අප ථෙරවාදී නොවේ යැයි කියා අපට ගරහා අප ජනතාවගෙන් ඈත්කිරීම ඊයේ පෙරේදා වනතුරු ජාතික ව්‍යාපාරයේ උන්නා ද මළා ද කියාවත් නොදැන සිටි රැකියාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු තම සිංහල බෞද්ධකම ප්‍රදර්ශනය කරන උගතුන්ගේ අභිප්‍රාය විය හැකි ය. ඒ කෙසේ වුවත් ථෙරවාදී බෞද්ධ යැයි කියන උගතුන් බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් එකඟ නොවන බව අපි දනිමු. එසේ නම් අප හා ඔවුන් අතර වෙනස්කම් තිබීම ප්‍රශ්නයක් වන්නේ කෙසේ ද? ඔවුන් කියනු ඇත්තේ සත්භව ආදී ඉහත සඳහන් ප්‍රධාන කරුණු ගැන ඔවුනොවුන් අතර එකඟත්වයක් ඇති බව ය. අපි ඒ එකඟත්වය දැනගැනීමට සියලු දෙනාට ම නිබන්ධනයක් ලිවීම සඳහා ප්‍රශ්නයක් සපයමු. ධර්මතාවක් ඉපදී ක්‍ෂණයක් පැවතී භංගවන්නේ කිනම් ආකාරයකට වුව ද පවතින මනසකට සාපේක්‍ෂව ද නැද්ද යන්න විමසා රහතන් වහන්සේ නමක් පිරිනිවන් පෑමේ දී පවත්නා මනසක් වේ නම් එයට සිදුවන්නේ කුමක් දැයි ථෙරවාදී බුද්ධදහම ඇසුරෙන් පැහැදිලි කරන්න.

උගතුන් නිබන්ධනය ලියන තෙක් අපි එතරම් බැරෑරුම් නොවන ප්‍රශ්නයක් දෙකක් සලකා බලමු. කලකට පෙර එක්තරා උගතෙක් මෙවැනි ප්‍රකාශයක් කෙළේ ය. ඒ පඬිවරයාගේ ඇමරිකාවේ වසන මිතුරකුගේ පුතකු සිද්ධාර්ථ කුමරු සතර පෙර නිමිති දැකීමට පෙර අවුරුදු විසිනවයක් ම මහල්ලකු ලෙඩකු මළකඳක්, පැවිද්දකු නොදැක සිටියේ කෙසේ දැයි එතුමාගෙන් ඇසුවේලු. ඒ කාලයෙහි සිද්ධාර්ථ කුමරු, ශුද්ධෝදන රජු ආදී මාළිගාවෙහි වාසය කළ කිසිවකු ලෙඩ නො වී ද? මහලු නො වී ද? නො මළේ ද? ඇමරිකාවේ වසන පොඩි කොල්ලකුට එවැනි ප්‍රශ්න නැගීමට හැකිවුයේත් අපට කුඩාකල තබා පසුවවත් ඒ ප්‍රශ්න ඇති නොවුයේත් ඇයි? අර පොඩි එකාට නොසෑහෙන බුද්ධියක් තිබේ ද? අපට බුද්ධියක් නැද් ද?

පොඩි එකාට අප පිළිතුරක් දෙන්නේ කෙසේ ද? ශුද්ධෝදන රජු මාළිගාව වටා තාප්ප බැඳ මාළිගාවට මහල්ලන්, පැවිද්දන්, රෝගීන් පැමිණීම තහනම් කෙළේ යැයි කියමු ද? මාළිගාවේ සිටි අය මහලුවන විට ඔවුන් මාළිගාවෙන් පිටමං කෙළේ යැයි කියමු ද? මාළිගාවේ යම් අයකු මියගියහොත් සිද්ධාර්ථ කුමරුට දැනෙන්නට ඉඩ නොතබා මෘතදේහය පිටත්කර හැරියේ යැයි කියමු ද? එවැන්නන් ගැන සිද්ධාර්ථ කුමරු ප්‍රශ්න කළහොත් ඔවුන් හැංගි මුත්තන් සෙල්ලම් කරන්නේ යැයි කියා සිද්ධාර්ථ කුමරුට ඔවුන් සොයන ලෙස ශුද්ධෝදන රජතුමා අභියෝග කෙළේ යැයි කියමු ද? සිද්ධාර්ථ කුමරු පිටතට යන විට ජනතාවගේ ගමනාගමන කටයුතු නවතා කල්වේලා ඇතිව මහල්ලන් ආදීන් මහමගින් ඉවත්කෙළේ යැයි කියමු ද? ඇමරිකාවේ වසන බුද්ධිමත් යැයි කියන පොඩි කොලුවකු ඒ පිළිතුරු භාරගනී විද?

එසේත් නැත්නම් පුතා තවම පොඩි වැඩියි පස්සෙ ඕව තේරෙයි කියා ශුද්ධෝදන රජු මාළිගාවෙන් මහල්ලන් පිටත්කෙළේ යැයි සිතිය හැකි වේගයටත් වැඩි වේගයකින් එතැනින් ඉවත් වෙමු ද? එසේත් නැත්නම් පොඩි එකා හරිහැටි හදා නැතැයි ඔහුගේ මවට දොස් කියමු ද? අපේ උගතා ඒ කිසිවක් කළ බවක් සඳහන් නො වී ය. එහෙත් එවැනි පොඩි එවුන් ඇත්තේ ඇමරිකාවේ වෙසෙන සිංහල බෞද්ධ පවුල්වල පමණක් නො වේ. මෙරට විශ්වවිද්‍යාලවල

© Prof. Nalin De Silva

ද එවැන්නෝ වෙති. කථිකාචාර්යවරුන් මහාචාර්යවරුන් අතර ද එවැනි පොඩි එවුන් දැකගත හැකි ය. කලකට පෙර රූපවාහිනියේ දැන්වීමක පොඩිහිටියෝ යන වචනය කුඩාවුන් සඳහා යොදා ගැනිණි. පොඩිහිටියෝ යන්න හොඳ වචනයකි. ඒ පොඩිඩන් සඳහා යොදාගැනුමට නො වේ. මනසින් නොවැඩී පොඩිඩන්ගේ වයසේ ම හිටියවුන් සඳහා පොඩිහිටියෝ යන්න යොදාගත හැකි ය. අපේ උගතා ද එකල පොඩිහිටියෙකි. මේ පොඩිහිටියන් බොහෝ දෙනකු ප්‍රභාකරන්ගේ පරාජයත් සමග වැඩිහිටියන් බව පෙන්වීමට උත්සාහ ගනු දැකිය හැකි ය. එදා ෆෙඩරල් ගැන තොරතෝංචියක් නැතිව කෑ ගැසූ මොවුහු අද ඊගැයියන් මෙන් කෑගසමින් ඒකීය විසඳුම් ගැන අපට කියා දෙති.

මේ විවිධාකාර පොඩිහිටියන් එවැනි ප්‍රශ්න නගන්නේ ඔවුන් එම උගත්කම ලබාගත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය; ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. එහෙත් ඔවුන්ට ඒ චින්තනයෙහි හා සංස්කෘතියෙහි ද එතරම් ගැඹුරකට ගිය අත්දැකීමක් නැති බව පැහැදිලි ය. ඔවුන්ට ඇත්තේ ඉතාමත් මතුපිට දැනුමකි. සිද්ධාර්ථ කුමරු අවුරුදු විසිනවයක් වන තුරු මහල්ලකු ලෙඩකු මළකඳක් පැවිද්දකු දැක නොතිබූ බවක් සිද්ධාර්ථ කුමරු ගිහිගෙය අත්හැර යෑම පිළිබඳ කතාවෙන් කියැවෙන්නේ ද? මහල්ලන් ලෙඩුන් මළකඳන් දුටු පමණින් මිනිස්සු ගිහිගෙය අත්හැර නො යති. අදත් ඇතැම්හු විවිධ හේතු නිසා ගිහිගෙය අත්හැර යති. සසර කළකිරීම ද එක් හේතුවක් වේ. සිද්ධාර්ථ කුමරුගේ අභිනිෂ්ක්‍රමණය ඉබේ සිදුවූවක් නො වේ. ඒ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පිරීමේ ප්‍රතිඵලයකි. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයේ කතාව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හසු නො වේ. එබැවින් විවිධ පොඩිහිටියෝ ඒ නොසළකා හරිති. පොඩිහිටියන්ට ගෝචර නොවූ පමණින් අපි ඒ ගැන කලබල නො වෙමු. ක්වොන්ටම් භෞතික විද්‍යාව ද බටහිර භෞතික විද්‍යාඥයන්ට ද මෙරට පොඩිහිටියන්ට ද නො තේරේ. අපට ඒ ගැන කරන්නට දෙයක් නැත. ඔවුන් තම චින්තනය වෙනස්කර ගන්නේ නම් අපට තේරෙන දේ ඔවුන්ට ද තේරෙනු ඇත.

එහෙත් පොඩිහිටියන් තරමක් කල්පනා කරන්නේ නම් සිද්ධාර්ථ කුමරුගේ අභිනිෂ්ක්‍රමණයෙහි ඔවුන්ට ද තේරුම්ගත හැකි දෙයක් ඇත. සිද්ධාර්ථ කුමරු අවුරුදු විසිනවයක් ම මහල්ලන් ලෙඩුන් මළකඳන් පැවිද්දන් ඇසින් දකින්නට ඇත. එහෙත් එයින් කියැවෙන්නේ කුමක් ද යන්න නොදකින්නට ඇත. සසර දුකක් බව ද අනිත්‍ය බව ද එහෙත් මේ දුකින් මිදීමට මගක් ඇති බව ද එතුමා තේරුම් ගන්නට ඇත්තේ, එසේ දකින්නට ඇත්තේ අවුරුදු විසිනවයක් ගතවීමෙන් පසුව ය. පොඩිහිටියන්ගේ ස්වාමිවරුන්ගේ බසින් කියන්නේ නම් ඒ සුසමාදර්ශ වෙනසකි. සුසමාදර්ශය වෙනස් කිරීමෙන් පසු අපට පෙනෙන්නේ අප කලින් දුටු දේ නො වේ. පොඩිහිටියන්ට චින්තනය ද වෙනස්කර ගත හැකි නම් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂය ද පෙනෙනු ඇත. එහෙත් ඔවුන්ට ඒ සඳහා අඩුම තරමින් දෙතිස්සංඛ්‍ය කල්ප ලක්ෂයක්වත් ගතවනු ඇත.

ඇතැම් පොඩිහිටියෝ උදේ සවස, විශේෂයෙන් ම පිංකමකට පෙර පන්සිල් ගන්නේ ඇයි දැයි අසති. එහෙත් ඔවුහු දිනපතා බැරිනම් සතිපතා ඇතැම් උත්සවවලට පෙර තම මෝටර්රථ සෝදති. තම සිරුරු නාවති. ඒ කුණු තැවරී ඇති නිස යැයි ඔවුන් කියනු ඇත. එහෙත් තමන් පන්සිල් රකින නිසා නැවතත් පන්සිල් ගැනීමේ අවශ්‍යතාවක් නැතැයි ඔවුන් කියනු ඇත. එහෙත් පොඩිහිටියෝ ද අප මෙන් ම පෘථග්ජනයෝ වෙති. ඔවුන්ගේ සිත් දිගින් දිගට ම නොකිලිටි ව ඇතැයි ඔවුන්ට ස්ථිර වශයෙන් ම කිව හැකි ද? පින්කමකට පෙර පන්සිල් ගැනීමෙන් අඩුම තරමෙන් සුළු කාලයක් හෝ සිල්වතකු වශයෙන් පින්කමක් කරගැනීමේ අවස්ථාව අපට උදාවනු ඇත.

මේ සියලු ප්‍රශ්න  පසුපස ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි  නිර්මාණය කෙරී පොඩිහිටියන් ලැබූ දැනුම ය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි දැනුම ලැබූවන්ට ප්‍රශ්න පෙනෙන්නේ ඒ සංස්කෘතියෙහි ය. ඔවුන්ට කෙසේ නම් ඒ ප්‍රශ්නවලට දේශජ විසඳුම් දිය හැකි ද? දේශජ විසඳුම් දිය හැක්කේ දේශීය ව දකින ප්‍රශ්නවලට ය. පන්සිල් ගැනීම වේවා සිද්ධාර්ථ කුමරුගේ අභිනිෂ්ක්‍රමණය වේවා අප අපේ පැත්තේ සිට බලන්නේ නම් අපට පොඩිහිටියන්ගේ විසඳුම්වලට වෙනස් විසඳුම් ලැබෙනු ඇත. දෙමළ ප්‍රශ්නයට විසඳුම් සොයන්නන් ද අපේ පැත්තෙන් ප්‍රශ්නය දෙස බලන්නේ නම් චින්තනය බැරිනම් අඩුම තරමින් සුසමාදර්ශය වෙනස්කරන්නේ නම් වෙනත් විසඳුම් ලැබෙනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva